| | |
|---|---|
| ITB 23.1 | ලංසු ඉදිරිපත් කිරීම සඳහා, සේවායෝජකයාගේ ලිපිනය වන්නේ:<br><br>අවධානය : සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව<br><br>ලිපිනය : සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, ශික්ෂණ රෝහල, පේරාදෙණිය |
| ITB 26.1 | ලංසු විවෘත කිරීම සිදු වන්නේ:<br>ලිපිනය : රෝහලේ අධ්‍යක්ෂ කාර්යාලය<br><br>**දිනය : 2025.04.17**<br><br>**වේලාව : පෙ.ව 10.30** |
| | **E. ලංසු ඇගයීම සහ සංසන්දනය** |
| ITB 33.4 | ඇගයීම සඳහා පහත සඳහන් සාධක සහ ක්‍රමවේදය භාවිතා කරනු ඇත:<br><br>1. ඉහත ඉ කොටසෙහි අංක a සිට k හි දැක්වෙන සියලුම ලේඛන නොඅඩුව ඉදිරිපත් කළ යුතු අතර ඉන් එකක් හෝ ඉදිරිපත් කර නොමැති ලංසු මූලික සුදුසුකම් පරීක්ෂාවේදි ඇගයීමෙන් ඉවත් කරනු ලැබේ. තවද l සිට u දක්වා වන සෙසු ලේඛන මූලික ලංසු ඇගයීමේදී ඉදිරිපත් නොකිරීම සුළු අපගමනයන් (Minor deviation) ලෙස සළකනු ලැබේ. කෙසේ වෙතත් අවසන් ඇගයීමේදී ඉදිරිපත් කර ඇති සියළු ලේඛන පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.<br><br>2. අවශ්‍යතා උපලේඛනයේ (IV කොටසේ) 5 ලැයිස්තුවේ කම්කරු දෙපාර්තමේන්තුවේ තත්කාලීන නීතිමය ප්‍රතිපාදනවලට අනුකූලව ආයතනය සඳහා සඳහන් කර ඇති තොරතුරුවලට අනුව වාර්ෂික ශ්‍රම පිරිවැය ගණනය කර ඉදිරිපත් කළ යුතුය.<br><br>3. වාර්ෂික පොදු කාර්යය සඳහා වන පිරිවැය ලංසුවෙහි III කොටසේ අංක 02 යටතේ වන ලංසුකරු විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික පිරිවැය ලේඛණයේ අංක 05 යටතේ සඳහන් කර ඇති වැටුප් සහ අතිකාල සඳහා වන මුළු වියදමෙන් 20% ක් නොඉක්මවිය යුතුය.<br><br>4. ලංසු ඉදිරිපත් කළ ආයතනයන්ට එරෙහිව ආයතනයෙහි දෛනික කටයුතුවලට දැඩි බලපෑමක් එල්ල වන ආකාරයේ පැමිණිල්ලක් හෝ පැමිණිලි ලැබී තිබේ නම් එය පශ්චාත් සුදුසුකම් පරීක්ෂාවේ දී ප්‍රතිචාරාත්මක ලංසුකරුවෙක් ලෙස නොසැළකීමට හේතුවක් වේ.<br><br>5. රාජ්‍ය ව්‍යාපාර සඳහා 2020.11.09 දිනැති අංක 04/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් ලබා දී ඇති ප්‍රතිපාදන අදාළ කරගනු ලැබේ. |
| | **කාර්ය සාධන සුරක්ෂණය** |
| ITB 41.1 | ලංසු ප්‍රදානය ලද කොන්ත්‍රාත්කරු, ලංසු පිළිගැනීමේ ලිපිය ඉදිරිපත් කර දින 14ක් ඇතුළත ලංසුවේ කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් 10%ක් හෝ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය අනුව දැනුම් දෙනු ලබන වටිනාකමින් යුත් කාර්යසාධන බැඳුම්කරයක්, මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවකින් ලබා ගෙන අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල, පේරාදෙණිය නමට ඉදිරිපත් කළ යුතුය. |